# GMOA

ESTABLISHED IN 1926
TU No. 291

THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION

No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07

Tel : 2580886 / 0714 999555
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk


20-07-2012

**මාධ්‍ය නිවේදනය**

යාපනය ශික්ෂණ රෝහලේ සිදුවූ මුල්‍ය අක්‍රමිකතා සම්බන්ධව වෛද්‍යවරුන් විසින් සෞඛ්‍ය අමාත්‍යංශය වෙත කරන ලද පැමිණිල්ල අනුව එහි විමර්ශන ඒකකය මගින් පවත්වන ලද මූලික විමර්ෂනයෙන් අදාල චෝදනාවල සත්‍යතාවයක් ඇති බවත් රෝහල් අධ්‍යක්ෂකවරිය ඇතුලු තවත් අයවලුන්ට එරෙහිව විධිමත් පරීක්ෂණයක් පැවැත්විය යුතු බවත් නිර්දේෂ වී ඇත. එහෙත් ඉතා කණගාටුදායක ලෙස සෞඛ්‍ය අමාත්‍යංශයේ උසස් නිලධාරීන් විසින් උවමනාවෙන්ම අපක්ෂපාති පරීක්ෂණයක් පැවත්වීමේ කටයුත්තට අකුල් හෙලන අතර යාපනය රෝහලේ වෛද්‍යවරුන්ගේ තත්ත්වය තවදුරටත් අනාරක්ෂිත වෙමින් පවති.

මෙහි නවතම සිදුවීම වනුයේ යාපනය රෝහලේ රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ ශාඛා සමිතියේ සභාපති වෛද්‍ය එස්. නිමලන් මහතාට 19-07-2012 වන දින ලැබුනු නිර්නාමික මරණ තර්ජනයයි. මෙය සම්බන්ධව සැලකීමේ දී මීට මසකට පමණ පෙර විශාල අලාභ හානියක් ගෙන දෙමින් පිළිකා රෝග විශේෂඥ වෛද්‍ය ජයකුමරන් මහතාගේ නිවසට කරන ලද මැර ප්‍රහාරය සලකා බැලීමද වැදගත්ය.

මේ අනුව 24-07-2012 දිනට පෙර මෙම විධිමත් විනය පරීක්ෂණයේ අපක්ෂපාතිභාවය තහවුරු කිරීමට සෞඛ්‍ය අමාත්‍යංශය කටයුතු නොකල හොත් උතුරු පළාතේ සියලුම මහ රෝහල් හා පළාත් සභාව යටතේ පවතින වෛද්‍ය ආයතනද ආවරණය වන පරිදි වෘත්තීය සමිති ක්‍රියා මාර්ගයකට අවතීර්ණ වීමට සිදු වනු වැලැක්විය නොහැකි වනු ඇත.

මෙහිදී සියලු අත්‍යවශ්‍ය හා හදිසි රෝගී සත්කාර කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාමට යොදා ඇති අතර සාමාන්‍ය ජනතාවට සිදුවන සියලු දුෂ්කරතා වල වගකීම් සෞඛ්‍ය අමාත්‍යංශයේ සිටින දූෂණ සහ අක්‍රමිකතාවයන්ට සහය දෙන නිලධාරීන් භාරගත යුතුය.

ස්තුතියි

වෛද්‍ය චන්දික එපිටකඩුව
ලේකම්

වැඩි විස්තර - වෛද්‍ය නලින් ආරියරත්න 0714800942
වෛද්‍ය නවීන් ද සොයිසා 0718582444